# දෙවනගල රජමහා විහාරයේ අගයන් පිළිබඳ අධ්‍යයනයක්

*බී.ආර්.අයි. විනෝදනී බෝරදෙනිය[1]*

රටක උරුමය අතීත පරම්පරාවෙන්ගෙන් වර්තමානයට ලබාදෙන්නා වු දායාදයක් වන අතර උරුමයේ වටිනාකම රඳා පවතින්නේ එහි පවතින අගයන් තුළිනි. උරුමයකට පුද්ගලික, ප්‍රාදේශීය, ජාතික හෝ අන්තර්ජාතික වටිනාකමක් ලබා දෙන්නේ අගයන් හරහා ය. ඒ අනුව කෑගල්ල දිස්ත්‍රික්කයේ මාවනැල්ල - හෙම්මාතගම මාර්ගයේ දෙවනගල ප්‍රදේශයේ අක්කර 72ක පමණ විශාලත්වයකින් යුතු පර්වතයක් මත ඉදි කර ඇති දෙවනගල රජමහා විහාරයේ අගයන් පිළිබඳ අධ්‍යයනය කිරීම මෙහි අරමුණයි. මෙම අධ්‍යයනය සඳහා ක්ෂේත්‍ර ගවේෂණය මඟින් සහ ප්‍රාථමික සහ ද්විතියික මූලාශ්‍රයන් පරිහරණය හරහා තොරතුරු ලබා ගන්නා ලදී. උරුමයක අගයන් පිළිබඳ විමසීමේ දී භාව විෂයයික අගයන්, සංස්කෘතික අගයන් සහ ව්‍යවහාරික අගයන් ලෙස ප්‍රධාන වසයෙන් අගයන් හඳුනාගත හැකි ය. ඒවා යටතේ තවත් අගයන් ගණනාවක් පවතී. උරුම ස්ථානයක් සංරක්ෂණය කිරීමට පෙර මෙම අගයන් සියල්ල හඳුනාගැනීම ඉතා මත් වැදගත් වේ. දෙවනගල රජමහා විහාරයේ පෞරාණික, පුරාවිද්‍යාත්මක සහ සෞන්දර්යාත්මක ලක්ෂණවලින් යුතු ස්මාරක සහ ඒ ආශ්‍රිත පරිසරය නිසා ම එහි අගයන් රැසක් හඳුනාගත හැකි ය. දෙවනගල රජමහා විහාරය පිහිටා ඇති පර්වතයේ උසම කොටසේ ටැම්පිට පිළිමගෙය, දාගැබ, ධර්ම ශාලාව, පැරණි සංඝාවාසය සහ ශෛලමය විහාරයේ නටබුන් මෙන් ම අලංකාර පොකුණක් ද දක්නට ලැබේ. මෙම සියලු ස්මාරක හරහා දෙවනගල රජමහා විහාරයට ලැබී ඇත්තේ සුවිශේෂී වටිනාකමකි. විශේෂයෙන් ම මෙහි මහනුවර යුගයට ආවේණික වාස්තු විද්‍යාත්මක ලක්ෂණවලින් යුතු ටැම්පිට ප්‍රතිමාඝරය සහ එහි බිතුසිතුවම් තුළින් පුරාවිද්‍යාත්මක, වාස්තු විද්‍යාත්මක, සංස්කෘතිමය හා කලාත්මක අගයන් රැසක් හඳුනාගත හැකි විය. එසේ ම විහාරයේ ගල් තලාව මත දක්නට ලැබෙන පළමු පරාක්‍රමබාහු රජු සහ විමලධර්මසූරිය රජු විසින් කරවන ලද සෙල්ලිපි මගින් දෙවනගල රජමහා විහාරයේ උරුමයන්හී වටිනාකම විදහා දක්වයි. මෙම ස්ථානයේ භූගෝලීය පිහිටීම එයට ම ආවේණික වූ පාරිසරික සුවිශේෂීතාව නිසා ම සෞන්දර්යාත්මක, ආශ්චර්යාත්මක අගයන් පවතින බව මෙම අධ්‍යයනය මඟින් හඳුනාගත හැකි විය. මුලාශ්‍රයගත තොරතුරු අනුව අනුරාධපුර යුගය දක්වා ඈත ඉතිහාසයක් ඇති දෙවනගල රජමහා විහාරයේ අගයන් රැසක් වර්තමානය දක්වා ම නො නැසී පවතින බව මෙම පර්යේෂණය මඟින් ගම්‍යමාන විය.

***ප්‍රමුඛ පද:*** දෙවනගල, රජමහා විහාරය, පුරාවිද්‍යාත්මක, උරුම අගයන්

[1] පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලේ. imeshavinodani332@gmail.com